# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 නොවැම්බර් 09 |


# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 සැප්තැම්බර්

## සුවිශේෂ සිදුවීම්

| | 2020 සැප්තැම්බර් | 2020 ජනවාරි - සැප්තැම්බර් |
|---|---|---|
| වෙළඳ හිඟය | ↓ එ.ජ.ඩො. මිලියන 525<br>2019 සැප්. එ.ජ.ඩො. මිලියන 757 | ↓ එ.ජ.ඩො. මිලියන 4,337<br>2019 ජන. - සැප්. එ.ජ.ඩො. මිලියන 5,612 |
| වෙළඳ භාණ්ඩ අපනයන | ↑ එ.ජ.ඩො. මිලියන 1,000<br>2019 සැප්. එ.ජ.ඩො. මිලියන 954<br>4.8% වාර්ෂික ලක්ෂ්‍යමය | ↓ එ.ජ.ඩො. මිලියන 7,445<br>2019 ජන. - සැප්. එ.ජ.ඩො. මිලියන 8,984<br>-17.1% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන | ↓ එ.ජ.ඩො. මිලියන 1,525<br>2019 සැප්. එ.ජ.ඩො. මිලියන 1,711<br>-10.9% වාර්ෂික ලක්ෂ්‍යමය | ↓ එ.ජ.ඩො. මිලියන 11,782<br>2019 ජන. - සැප්. එ.ජ.ඩො. මිලියන 14,596<br>-19.3% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම්**

2020 සැප්.: -

2020 ජන. - සැප්.: එ.ජ.ඩො. මිලියන 956 (-63.1% වාර්ෂික ලක්ෂ්‍යමය) ↓

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2020 සැප්.: එ.ජ.ඩො. මිලියන 703 (36.1% වාර්ෂික ලක්ෂ්‍යමය) ↑

2020 ජන. - සැප්.: එ.ජ.ඩො. මිලියන 5,049 (2.4% වාර්ෂික ලක්ෂ්‍යමය) ↑

---

**කොළඹ කොටස් වෙළඳපොළ (ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ-ශුද්ධ)**
2020 සැප්.: එ.ජ.ඩො. මිලියන -42
2020 ජන. - සැප්.: එ.ජ.ඩො. මිලියන -215

**රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ)**
2020 සැප්.: එ.ජ.ඩො. මිලියන 9
2020 ජන. - සැප්.: එ.ජ.ඩො. මිලියන -512

**දළ නිල සංචිත**
2020 සැප්. අග: එ.ජ.ඩො. බිලියන 6.7
(ආනයනික මාස 4.7)

**විනිමය අනුපාතිකය (එ.ජ ඩොලරයට රුපියල්)**
2019 දෙසැ. අග: 181.6340
2020 සැප්. අග: 185.5224













ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.
සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

වෙළඳ හිඟය අඛණ්ඩව පහත වැටීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සැලකිය යුතු ලෙස වැඩි වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ස්ථාවරත්වය යනාදියෙහි හිතකර බලපෑම හේතුවෙන් 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් යථා තත්ත්වයට පත් විය. අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා භාණ්ඩ අපනයනය වර්ධනය වීමත්, මාසය තුළ භාණ්ඩ ආනයන අඩු වීමත් සමඟ වෙළඳ හිඟය පෙර වසර හා සසඳන විට 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී අඩු විය. 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2011 වසර අවසානයෙන් පසු ඉහළ ම වාර්ෂික වර්ධන වේගය වාර්තා කළේය. මූල්‍ය ගිණුමේ, රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ මෙම මාසය තුළ විදේශ ආයෝජන ලැබීම් සුළු ප්‍රමාණයක් වාර්තා වූ අතර, කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ගෙවීම් වාර්තා විය. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් විනිමය අනුපාතිකයට ඇති පීඩනය ලිහිල් කළ අතර, දළ නිල සංචිත ඉහළ නැංවීම සඳහා ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට මහ බැංකුවට හැකියාව ලැබිණි. මෙම ප්‍රවණතා නිරූපණය කරමින්, 2020 වසරේ සැප්තැම්බර් මාසය තුළ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 සැප්. එ.ජ.ඩො. මිලියන | 2020 සැප්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- සැප්. එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- සැප්. එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 954 | 1,000 | 4.8 | 8,984 | 7,445 | -17.1 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,711 | 1,525 | -10.9 | 14,596 | 11,782 | -19.3 |
| වෙළඳ ශේෂය | -757 | -525 | | -5,612 | -4,337 | |
| සංචාරක ඉපැයීම් | 205 (ආ) | - | - | 2,594 (ආ) | 956 (ඇ) | -63.1 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 516 | 703 | 36.1 | 4,930 | 5,049 | 2.4 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -7 | -42 | | 15 | 215 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 276 | 124 | | 5,957 | 1,427 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 22 | 10 | | 454 | 102 | |
| දිගුකාලීන ණය (ඉ) | 254 | 113 | | 1,103 | 1,325 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 4,400 | - | |
| විදේශ සෘජු ආයෝජන (ඊ) | | | | 535 | 345 | |
| සමස්ත ශේෂය | | | | 789 | -1,104 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) රජයේ දිගුකාලීන විදේශීය ණය සඳහා වූ මාසික දත්ත අගෝස්තු මාසය සඳහාත්, සමුච්චිත දත්ත පළමු මාස අට සඳහාත් පවතියි.
(ඊ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

- 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් මිලියන 525ක් වූ අතර, එය 2019 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 757ක හිඟයට වඩා සැලකිය යුතු පහත වැටීමකි. වෙළඳ හිඟයේ මෙම අඩු වීම සඳහා හේතු වූයේ 2019 වසරේ සැප්තැම්බර් මාසය හා සසඳන විට 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආනයන පහළ මට්ටමක පැවතීමත් අපනයන ඉහළ මට්ටමක පැවතීමත් ය.
- 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ සමස්ත වෙළඳ හිඟය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 5,612ක සිට එ.ජ.ඩොලර් මිලියන 4,337ක් දක්වා අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 01 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය, 2019 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 1.1කින් පහළ වැටුණු අතර, මේ සඳහා ආනයන මිල ගණන් පහත වැටීමේ වේගය අභිබවමින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

**රූප සටහන 1: 2020 වසරේ ජනවාරි - සැප්තැම්බර් කාලපරිච්ඡේදය තුළ වෙළඳ හිඟය අඩු වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම (එ.ජ. ඩො. මිලියන)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 -2020)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 -2020)**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- වර්තමානයේ පවතින ගෝලීය වෙළඳපොළ තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට අපනයන අංශයට ඇති හැකියාව සහ අපනයන ක්‍රියාකාරිත්වය කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිර යෑමට පටන් ගත් අවස්ථාවේ සිට වර්තමානය වන විට 'V' අක්ෂරයේ හැඩයට යථා තත්ත්වයට පත්වීම ද පිළිබිඹු කරමින්, 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සහ මාසික ලක්ෂ්‍යමය පදනම මත යන දෙයාකාරයට ම ඉහළ ගියේය. 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,000ක් වූ අතර, එය 2019 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 954ට සාපේක්ෂව සියයට 4.8ක සහ 2020 වසරේ අගෝස්තු මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 947ට සාපේක්ෂව සියයට 5.6ක ඉහළ යෑමකි. කෘෂිකාර්මික නිෂ්පාදිත බොහෝමයක සහ ඇතැම් කාර්මික අපනයන කාණ්ඩවල අපනයන ඉහළ යෑම අනෙකුත් කාර්මික අපනයනවල සහ ඛනිජ අපනයනවල පහත වැටීම ඉක්මවීම අපනයනවල සමස්ත වර්ධනය සඳහා හේතු විය.
- 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 10.4කින් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පොල් (පොල් මද ආශ්‍රිත හා පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත), කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු), තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් බුලත්) සහ මුහුදු ආහාර අපනයන ඉහළ යෑමය. තේ අපනයන පරිමාව සියයට 2.8කින් පහත වැටුණු නමුත්, තේ අපනයන මිල ගණන් ඉහළ යෑම (සියයට 6.3ක්) තේ අපනයන ආදායම සියයට 3.3කින් ඉහළ යෑමට හේතු විය.
- ඇතැම් අපනයන අංශවල දුර්වල ක්‍රියාකාරිත්වය සහ අනෙකුත් අංශවල ඉහළ ක්‍රියාකාරිත්වයෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2020 සැප්තැම්බර් මාසයේ දී කාර්මික අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.6කින් ඉහළ ගියේය. කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අපනයන

අංශ තුළට, ප්ලාස්ටික් ඇඳුම්, මුඛ ආවරණ හා අත්වැසුම් වැනි පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ ඇතුළත් වූ අතර, එම අයිතම, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, රෙදිපිළි හා ඇඟලුම් යටතේ වර්ග කර ඇති වෙනත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය සහ රබර් ආශ්‍රිත නිෂ්පාදිත යටතේ කාණ්ඩ කර ඇත. මෙම කාණ්ඩ තුනේ සමස්ත වැඩිවීම, ඇඟලුම් අපනයන ආදායමේ පහත වැටීම ඉක්මවා ගියේය. මේ අතර, ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ඒ සඳහා එම කාණ්ඩය යටතේ වර්ග කර ඇති බොහෝ එකතු කළ අගයක් සහිත ආහාර අයිතම අපනයන වර්ධනය වීම හේතු වූ අතර, අගය එකතු කළ පොල් නිෂ්පාදිතවල වැඩි වීම එහි ලා ප්‍රධාන විය. රබර් අත්වැසුම්වලට අමතරව, ටයර් වැනි වෙනත් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ද ඉහළ ගියේය. මේ අතර, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත අපනයනවල කැපී පෙනෙන ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, ඒ සඳහා ශ්‍රී ලංකාවේ මුද්‍රණය කළ වෙනත් රටවල මුදල් නෝට්ටු අපනයන ඉහළ යෑම හේතු විය. අපනයන ආදායම පහත වැටීමක් වාර්තා කළ කාර්මික අපනයන අංශ යටතට ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ මූල ලෝහ හා උපාංග ඇතුළත්ය. ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ අපනයන අඩු වීමත් යුරෝපා සංගමය වෙත සිදුකළ අපනයන සුළු වශයෙන් පමණක් ඉහළ යෑමත් සමඟ රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.7කින් අඩුවිය. නැව් සඳහා සපයනු ලබන ඉන්ධනවල මිල ගණන් මෙන්ම සැපයුම් පරිමාව ද පහත වැටීමත් සමඟ ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. තවද, 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ඛනිජ නිෂ්පාදිත අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහත වැටුණි.

- වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන ආදායම ඉහළ යෑම සඳහා ඉහළ අපනයන පරිමා සාමාන්‍යයෙන් හේතු වූ බව පිළිඹිබු කරමින් 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන පරිමා දර්ශකය සියයට 18.4කින් වර්ධනය වූ අතර, ඒකක මිල දර්ශකය සියයට 11.5කින් පහත වැටුණි.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: මාසික අපනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2019 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2020 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2019 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2020 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **747.6** | **774.5** | **3.6** | **7,077.8** | **5,680.0** | **-19.7** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 33.6 | 45.6 | 36.0 | 337.3 | 348.6 | 3.3 |
| සත්ත්ව ආහාර | 6.1 | 8.3 | 34.8 | 94.9 | 83.9 | -11.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 450.2 | 433.7 | -3.7 | 4,186.8 | 3,286.8 | -21.5 |
| එයින්, ඇඟලුම් | 419.1 | 391.6 | -6.6 | 3,897.6 | 2,919.7 | -25.1 |
| රෙදිපිළි | 23.0 | 26.6 | 15.9 | 210.5 | 181.6 | -13.7 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.2 | 15.5 | 89.3 | 78.7 | 185.5 | 135.7 |
| රබර් නිෂ්පාදිත | 70.9 | 78.0 | 9.9 | 662.2 | 566.9 | -14.4 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.6 | 20.2 | -17.9 | 224.5 | 122.9 | -45.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 33.0 | 35.8 | 8.5 | 308.0 | 245.3 | -20.4 |
| ප්‍රවාහන උපකරණ | 7.0 | 8.2 | 17.4 | 127.5 | 54.4 | -57.3 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 40.3 | 28.6 | -29.0 | 367.9 | 296.8 | -19.3 |
| රසායනික නිෂ්පාදිත | 13.7 | 16.0 | 16.5 | 134.1 | 123.7 | -7.8 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.6 | 9.8 | -7.5 | 101.4 | 74.4 | -26.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.7 | 10.4 | 512.5 | 33.1 | 36.3 | 9.6 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.1 | 5.9 | -27.4 | 82.2 | 44.0 | -46.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.8 | 34.1 | 483.7 | 55.1 | 106.7 | 93.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 14.3 | 8.6 | -39.9 | 135.3 | 84.6 | -37.5 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 3.2 | 3.2 | 1.1 | 22.8 | 16.6 | -27.5 |
| වෙනත් කාර්මික අපනයන | 24.4 | 28.1 | 15.2 | 204.7 | 188.3 | -8.0 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **201.5** | **222.5** | **10.4** | **1,868.9** | **1,738.5** | **-7.0** |
| තේ | 110.4 | 114.0 | 3.3 | 1,025.3 | 919.6 | -10.3 |
| රබර් | 1.5 | 2.1 | 41.0 | 20.1 | 19.9 | -0.9 |
| පොල් | 26.3 | 35.8 | 35.8 | 258.5 | 257.3 | -0.5 |
| කුළුබඩු | 31.4 | 38.6 | 22.9 | 234.8 | 233.1 | -0.7 |
| එළවළු | 2.9 | 2.3 | -18.6 | 24.1 | 28.5 | 18.4 |
| සකස් නොකළ දුම්කොළ | 3.1 | 2.7 | -12.2 | 25.8 | 19.7 | -23.7 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 10.0 | 10.8 | 7.8 | 80.0 | 111.1 | 38.8 |
| මුහුදු ආහාර | 15.9 | 16.2 | 1.8 | 200.4 | 149.4 | -25.5 |
| **3. ඛනිජ අපනයන** | **3.3** | **1.7** | **-49.9** | **24.7** | **15.9** | **-35.4** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.4** | **1.3** | **-3.5** | **12.7** | **10.7** | **-15.8** |
| **මුළු අපනයන** | **953.8** | **1,000.0** | **4.8** | **8,984.0** | **7,445.0** | **-17.1** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2020 වසරේ මාර්තු මාසයේ සිට සෑම මාසයකම දක්නට ලැබුණු වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ආනයන පහත වැටීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින්, 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2019 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,525ක් දක්වා සියයට 10.9කින් පහත වැටුණි. 2020 වසරේ මාර්තු මාසයේ සිට රජය විසින් තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් පහළ මට්ටමක පැවතීම ආනයන වියදම පහත වැටීම සඳහා මූලික වශයෙන් හේතු විය.
- කෙසේ වුවද, 2020 වසරේ සැප්තැම්බර් මාසයේ ආනයන වියදම, 2020 වසරේ මාර්තු මාසයේ සිට සියලුම මාසවලට සාපේක්ෂව ඉහළ අගයක් වාර්තා කළ අතර, එය 2020 වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව සියයට 18.3කින් ඉහළ ගොස් ඇත. 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.
- 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2019 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව සියයට 14.8කින් පහත වැටුණු අතර, මේ සඳහා පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වූ රථ වාහන, රෙදිපිළි හා උපාංග සහ රජය මගින් සීමා කරන ලද අනෙකුත් අයිතම ආනයන පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. එනමුත්, ප්‍රධාන වශයෙන් සීනි, කිරිපිටි සහ පොල් තෙල් ආනයන ඉහළ යෑම හේතුවෙන් ආහාර හා පාන වර්ග ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. සීනි හා කිරිපිටි ආනයන පරිමාව කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. සීනි මිල ගණන් 2019 වසරේ සැප්තැම්බර් මාසයට වඩා 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී තරමක් ඉහළ ගිය අතර, යොදය සහිත කිරිපිටි ආනයන මිල ගණන් ලෝක වෙළඳපොළෙහි මිල ගණන්වලට අනුරූපව අඩු විය. ආනයන සීමා කිරීම්වලට යටත් නොවන හෝ සාපේක්ෂ වශයෙන් ලිහිල් සීමාවලට යටත් වන ඖෂධීය නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් බෙහෙත්), විදුලි සන්දේශ මෙවලම් (ප්‍රධාන වශයෙන් ජංගම දුරකථන), ශීතකරණ හා බත් පිසීමට භාවිත කරන විදුලි උපකරණ වැනි ගෘහ උපකරණ සහ සනීපාරක්ෂක උපකරණ වැනි, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද ඉහළ ගියේය. මෙයට ප්‍රතිවිරුද්ධව, එළවළු, පලතුරු, කුළුබඩු සහ පාන වර්ග වැනි ආහාර අයිතමවල ආනයන වියදම 2019 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී පහත වැටුණි.
- ගෝලීය වෙළඳපොළ තුළ පවතින ඛනිජ තෙල් මිල ගණන් අඩු මට්ටමක පැවතීමේ සහ ආනයනය කරන ලද පරිමාව අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන ආනයන වියදම සියයට 39.5කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන 2019 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම සියයට 11.7කින් පහත වැටුණි. බොර තෙල් බැරලයක ආනයන මිලෙහි සාමාන්‍යය 2019 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 67.73ට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 44.05ක් විය. සමස්ත ආනයන වියදම පහත වැටීම සඳහා දායක වූ වෙනත් අන්තර් භාණ්ඩ වනුයේ රෙදිපිළි හා රෙදිපිළි උපාංග, පොහොර, දියමන්ති සහ සකස් නොකළ දුම්කොළ යනාදියයි. කෙසේ වෙතත්, මූල ලෝහ (ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ), තිරිඟු, ප්‍රාථමික ස්වරූපයේ ප්ලාස්ටික් හා උපාංග සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.

- ප්‍රධාන වශයෙන් ආනයන සීමා හේතුවෙන් ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති උප කාණ්ඩ දෙකක් වන ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ සඳහා ආනයන වියදම, පිළිවෙලින් සියයට 31.6කින් සහ සියයට 56.3කින් පහත වැටුණු අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය යටතේ වර්ග කර ඇති යකඩ හා වානේ හා ඒ ආශ්‍රිත උපාංග, සිමෙන්ති, පිඟන් මැටි නිෂ්පාදිත, ඇලුමිනියම් උපාංග, පරිවරණය කළ රැහැන් හා කම්බි වැනි අයිතම සහ ප්‍රවාහන උපකරණ යටතේ වර්ග කර ඇති බස්රථ, ත්‍රීරෝද රථ සහ වාණිජ කටයුතු සඳහා භාවිත කරන වෙනත් රථ වාහන සහ දුම්රිය සඳහා භාවිත කරන උපකරණ වැනි අයිතම ආනයන සැලකිය යුතු ලෙස පහත වැටුණි. ආනයන සීමාවලට යටත් නොවන ට්‍රැක්ටර් ආනයනය ඉහළ ගියේය. ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති අනෙකුත් උපකාණ්ඩය වන යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය 2019 වසරේ සැප්තැම්බර් මාසයට සාපේක්ෂව මෙන්ම 2020 වසරේ පෙබරවාරි සිට අගෝස්තු දක්වා මාසවල දී දක්නට ලැබුණු ආනයන අගයන්වලට සාපේක්ෂව 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා දොඹකර සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස් ආනයනය ඉහළ යෑම හේතු විය. මීට අමතරව, ඉලෙක්ට්‍රොනික හා විද්‍යුත් යන්ත්‍රසූත්‍ර හා උපකරණ, වෛද්‍ය හා රසායනාගාර උපකරණ, කාර්යාලයීය උපකරණ සහ වායු සමීකරණ යන්ත්‍ර වැනි ආනයනවලට සාපේක්ෂව අඩු දායකත්වයක් දක්වන බොහෝ අයිතමවල ආනයනය ද ඉහළ ගියේය.
- 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය යන දර්ශක දෙකම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පිළිවෙලින් සියයට 0.4කින් සහ සියයට 10.5කින් පහත වැටුණු අතර මෙමගින් ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමාව පහත වැටීම මෙන්ම මිල ගණන් අඩු වීම ද හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2019 සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2020 සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2019 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | 2020 ජන.-සැප්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **312.8** | **266.5** | **-14.8** | **2,812.0** | **2,566.9** | **-8.7** |
| ආහාර හා පාන වර්ග | 92.2 | 125.2 | 35.9 | 1,009.3 | 1,148.9 | 13.8 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.6 | 3.1 | 18.1 | 24.8 | 24.1 | -2.9 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 8.9 | 24.1 | 171.3 | 225.0 | 253.0 | 12.5 |
| එළවළු (ආ) | 20.0 | 16.2 | -19.3 | 207.6 | 262.5 | 26.4 |
| මුහුදු ආහාර | 14.3 | 14.0 | -1.6 | 160.0 | 153.5 | -4.1 |
| සීනි හා රසකැවිලි | 16.2 | 38.0 | 134.2 | 142.6 | 200.6 | 40.6 |
| කුළුබඩු | 11.4 | 10.2 | -11.1 | 79.5 | 94.3 | 18.6 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 18.7 | 19.7 | 5.1 | 169.7 | 160.9 | -5.2 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 220.6 | 141.3 | -36.0 | 1,802.7 | 1,418.0 | -21.3 |
| පෞද්ගලික රථවාහන | 70.1 | 0.6 | -99.1 | 566.5 | 281.4 | -50.3 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 48.9 | 56.4 | 15.5 | 399.4 | 441.7 | 10.6 |
| ගෘහ උපකරණ | 15.3 | 17.0 | 11.6 | 146.6 | 117.4 | -19.9 |
| රෙදිපිළි හා උපාංග | 29.2 | 15.4 | -47.1 | 203.6 | 153.1 | -24.8 |
| විදුලි සන්දේශ උපකරණ | 16.3 | 21.0 | 29.1 | 173.4 | 195.6 | 12.8 |
| ගෘහ හා දැව භාණ්ඩ | 18.0 | 12.9 | -28.5 | 122.7 | 104.4 | -14.9 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 22.9 | 17.9 | -22.0 | 190.5 | 124.3 | -34.7 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,000.7** | **883.3** | **-11.7** | **8,380.5** | **6,575.8** | **-21.5** |
| ඉන්ධන | 353.7 | 214.0 | -39.5 | 2,930.5 | 1,905.2 | -35.0 |
| එයින්, බොරතෙල් | 98.6 | 63.6 | -35.5 | 729.3 | 451.2 | -38.1 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 232.1 | 134.9 | -41.9 | 2,052.9 | 1,309.3 | -36.2 |
| ගල්අඟුරු | 23.0 | 15.5 | -32.6 | 148.3 | 144.7 | -2.4 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 20.7 | 9.8 | -52.7 | 139.1 | 67.2 | -51.7 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 250.3 | 208.3 | -16.8 | 2,127.1 | 1,665.5 | -21.7 |
| කඩදාසි හා ඝන කඩදාසි | 40.6 | 37.7 | -7.3 | 336.1 | 277.1 | -17.6 |
| කෘෂිකාර්මික යෙදවුම් | 13.6 | 15.1 | 10.6 | 140.7 | 147.6 | 4.9 |
| තිරිඟු හා ඉරිඟු | 30.5 | 60.7 | 99.3 | 233.9 | 290.0 | 24.0 |
| මූල ලෝහ | 42.5 | 75.4 | 77.3 | 408.7 | 321.9 | -21.2 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 50.2 | 64.6 | 28.7 | 445.1 | 388.5 | -12.7 |
| රසායනික නිෂ්පාදිත | 67.8 | 79.8 | 17.6 | 621.3 | 598.1 | -3.7 |
| පොහොර | 30.0 | 14.7 | -50.9 | 167.5 | 139.0 | -17.0 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 22.5 | 19.5 | -13.4 | 174.9 | 165.4 | -5.5 |
| ඛනිජ නිෂ්පාදිත | 22.0 | 24.5 | 11.4 | 159.0 | 132.1 | -16.9 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 56.3 | 59.4 | 5.5 | 496.5 | 478.1 | -3.7 |
| **3. ආයෝජන භාණ්ඩ** | **396.6** | **374.2** | **-5.7** | **3,398.4** | **2,627.4** | **-22.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 206.5 | 257.1 | 24.5 | 1,816.7 | 1,581.7 | -12.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 136.5 | 93.4 | -31.6 | 1,143.4 | 764.7 | -33.1 |
| ප්‍රවාහන උපකරණ | 53.2 | 23.2 | -56.3 | 433.4 | 278.6 | -35.7 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 0.4 | 18.4 | 4.9 | 2.4 | -51.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **0.8** | **107.7** | **5.2** | **12.2** | **134.7** |
| **මුළු ආනයන** | **1,710.5** | **1,524.9** | **-10.9** | **14,596.1** | **11,782.2** | **-19.3** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,356.8** | **1,310.9** | **-3.4** | **11,665.6** | **9,877.1** | **-15.3** |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචාරකයින් රට තුළට පැමිණීම වැළැක්වීම සඳහා සියලුම ගුවන්තොටුපොළ සහ වරාය වසා තැබීම හේතුවෙන් අඛණ්ඩව හයවන මාසයටත් 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී **සංචාරක පැමිණීම්** කිසිවක් වාර්තා නොවීය. එම නිසා, 2019 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළදී පැමිණි 1,376,312ක සංචාරකයන් ප්‍රමාණය හා සැසඳීමේ දී 2020 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සමස්ත සංචාරක පැමිණීම් ප්‍රමාණය 507,311ක් විය. ඒ අනුව, සංචාරකයින්ගේ පැමිණීම මත පදනම්ව ඇස්තමේන්තුගත කෙරෙන **සංචාරක ඉපැයීම්** 2020 වසරේ සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 63.1ක අඩු වීමකි.
- මේ අතර, **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** අඛණ්ඩව හතරවන මාසයටත් ඉහළ ගිය අතර, පෙර වසරේ සැප්තැම්බර් මාසය හා සැසඳීමේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 36.1ක හිතකර වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 703ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම වැඩි වීම, වසර තුළ වාර්තා වූ මුළු විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ප්‍රමාණය 2020 මාර්තු මාසයේ සිට මාස හයක් පුරා අඩු වීම් වාර්තා කිරීමෙන් අනතුරුව පළමුවරට වැඩි වීමක් වාර්තා කිරීම සඳහා උපකාරී විය. ඒ අනුව, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2019 වසරේ අනුරූප කාල පරිච්ඡේදය හා සැසඳීමේ දී 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 5,049ක් දක්වා සියයට 2.4කින් වර්ධනය විය.

**රූප සටහන 8: මාසික සංචාරක පැමිණීම්**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලධන ලැබීම්

- 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළ වෙත ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 9ක විදේශීය ආයෝජන ලැබීමක් වාර්තා වීම හේතුවෙන්, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සිදු කළ සමස්ත ශුද්ධ ගෙවීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 512ක් දක්වා අඩු විය. රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2020 වසරේ සැප්තැම්බර් මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 72ක සාපේක්ෂ අඩු මට්ටමක පැවතුණි.
- 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළවලින් සමන්විත **කොළඹ කොටස් වෙළඳපොළ** වෙතින් එ.ජ. ඩොලර් මිලියන 42ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. සමුච්චිත පදනම මත, 2020 වසරේ සැප්තැම්බර්වලින් අවසන් වූ මාස නවය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 215ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- මේ අතර, 2020 වසරේ අගෝස්තු මාසයේ දී රජය වෙත වූ **දිගු කාලීන ණය** එ.ජ. ඩොලර් මිලියන 50ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය (දත්ත පවතිනුයේ 2020 වසරේ අගෝස්තු මාසය අවසානය දක්වා පමණි).

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට **දළ නිල සංචිත** මට්ටම, එ.ජ. ඩොලර් බිලියන 6.7ක් වූ අතර, එය ආනයනික මාස 4.7කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 සැප්තම්බර් අවසානය වන විට මාස 6.5ක ආනයන ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.2ක් විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී ශ්‍රී ලංකා රුපියල, මාසය මැද දී දක්නට ලැබුණු යම් විචලනයකින් අනතුරුව සියයට 0.3කා සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. සමස්තයක් ලෙස, නොවැම්බර් 06 වැනි දින දක්වා කාලය තුළ දී රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 1.5ක සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. දළ නිල සංචිත ඉහළ නංවා ගැනීමේ අරමුණ සහිතව 2020 සැප්තැම්බර් මාසයේ දී ද විදේශ විනිමය මිල දී ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත්වීම් සිදු කළ අතර, 2020 වසරේ ඔක්තෝබර් මස අවසානය දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 302.6ක් මිල දී ගෙන ඇත. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 වසරේ නොවැම්බර් මස 06 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, යූරෝ, ස්ටර්ලින් පවුම, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (නොවැ. 06 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -1.5% |
| යූරෝ | -12.7% | +2.6% | -6.6% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | -1.5% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -6.1% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | -5.0% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +2.2% |

**මූලය:** ශ්‍රී ලංකා මහ බැංකුව